දෙලෝ වැඩ සාදන පින් කිරියවත්

සිංහලේ දෙවන මහ කව ලෙස සැලකන්නේ කාව්‍යශේඛරයයි. එය මහ කිවි තොටගමුවේ සිරි රහල් හිමියන් විසින් කෝට්ටේ යුගයේ දී රචනා කළ අගනා කෘතියකි. බණක් හෙළ කවියෙන් ඇසීම උලකුඩය දේවියගේ කැමැත්ත ය. උලකුඩය දේවිය නම් සවන පැරකුම්බාවන්ගේ දියණියෝ ය. ඇය රහල් හිමියන්ගේ සොයුරියකි. ඇගේ ඇරයුමෙන් කාව්‍යශේඛරය කරවන ලදි. එය වනාහි බණ මගත් කිවි මගත් දෙක ම රකිමින් ලියවුණ පළමු වන සිංහල කවයි. මෙයට වස්තු බීජය වූයේ ජාතක පොතේ එන සත්තුභත්ත ජාතකයයි. මහලු බමුණකු රූමත් තරුණියක ආවාහ කරගෙන හිමියා ගෙදරින් බැහැර කරවා සොර සැමියකු සමග විසූ ආකාරය වටා මෙහි කතා වස්තුව සැකසී ඇත.

තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණන් විසින් රචනා කරන ලද කාව්‍යශේඛරය කිවි පොතක් මෙන් ම බණ පොතක් ද වේ. එහි දොළොස් පින් කිරියවතක් උගන්වා තිබේ. මෙම පාඩමෙහි මූලික අදහස එම දොළොස් පින් කිරියවත් පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනිමයි.

පුණ්‍ය ක්‍රියා ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ද, දස පුණ්‍ය ක්‍රියා ද, දොළොස් පුණ්‍ය ක්‍රියා ද යනුවෙන් ත්‍රිවිධ වේ. මෙහි පුණ්‍ය ක්‍රියා නමින් හඳුන්වන්නේ කුමක් ද යි අපි පළමුකොට තේරුම් ගනිමු. පින් හෙවත් පුණ්‍ය යනු දාන සීලාදී යහපත් ක්‍රියාවන් ය. ඒවා සසර යහපත පිණිස ය. ලෞකික වූ ආයුෂ වර්ධනය, සැපය, බලය හා ප්‍රඥාව ද පුණ්‍ය ක්‍රියා හේතුවෙන් සසර උපනූපන් ජාතිවල මිනිසුනට ලැබෙන බව බුදු දහම උගන්වයි. එබැවින් සසර සැප කැමැත්තන් විසින් නැවත නැවතත් පින්කළ යුතු යැයි ද බුදු දහමේ උගන්වා තිබේ. එබඳු පුණ්‍ය ක්‍රියා වස්තු දහයකි.

1. දන් දීම
2. සිල් රැකීම
3. භාවනා කිරීම
4. පින් දීම
5. පින් අනුමෝදන් වීම
6. වතාවත් කිරීම
7. වැඩිහිටියන්ට ගරු බුහුමන් කිරීම
8. ධර්ම දේශනා කිරීම
9. ධර්ම ශ්‍රවණය කිරීම
10. ශ්‍රද්ධාව හා අවබෝධය වැඩෙන ක්‍රියාවන්හි නිරත වීම

අපි දැන් කාව්‍යශේඛරයේ 9 වන සර්ගයේ එන දොළොස් පින් කිරියවත් මෙසේ හඳුනා ගනිමු.

දන් සිල් බාව	නා
පින්දෙනු අනුමෝද	නා
බණසනු දේස	නා
පිදිය යුත්තන් පුදනු සම	නා

කරනු ද	වතාවත්	
පින්කරු ගුණ	වැනීමත්	
සරණ, සිහි	වීමත්	
දොළොස් පින් දැන කරව	යාපත්	**(40-41 කවි)**

මේ කවි දෙකෙන් කියවෙන්නේ,

1. දන් දීම
2. සිල් රැකීම
3. භාවනා කිරීම
4. පින් දීම
5. පින් අනුමෝදන් කිරීම
6. බණ කීම
7. බණ ඇසීම
8. පිදිය යුත්තන් පිදීම
9. වතාවත් කිරීම
10. පින් කරන අයගේ ගුණ වර්ණනා කිරීම
11. සරණ ගත වීම.
12. කළ කුසල් සිහි කිරිම යන පින්කම් දොළොස ගැනයි.

දන් දීම යනු දස වැදැරුම් වස්තු පූජා කිරීම ය.

බත් පැන් වත්	යහන	
මල් සුවඳ සහ	විලවුන	
පහනට තෙල්	විමන	
මෙලෙස දන්වත් සමග	වාහන	**(42 කවිය)**

බත්, පැන්, වස්ත්‍ර ඇඳ පුටු මේසාදිය, මල්, සුවඳ, විලේපන ද්‍රව්‍ය, තෙල්, ආවාස පහසුකම් හා වාහන පූජා කිරීම ආදි මේ දහය දාන වස්තු වේ. දානය යනු තමන් සන්තකයේ ඇති දේ පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් පූජා කිරීමයි, පරිත්‍යාග කිරීමයි.

දන් දුන් දෙය	ඉදිරි	
පල දෙයි නැණින් පෙර	දැරි	
දුන් දන් එලොබ	ඇරි	
ජවන් සිත මේ මෙකී රඟ	සරි	**(43 කවිය)**

දන් දුන් දෙයෙහි පල විපාක ඉදිරියේ දී ලැබෙන බවට සිත පෙරදැරි කර ගනිමින් මේ ආකාර වූ ප්‍රබල සිතින් යුතු ව දෙන ලද්ද ඒ දානමය කුසලය වේ.

කයින් තෙපුලෙන්	වන	
පවිනුත් යළි නපුරු	වන	
පසක් වෙළෙඳාමෙ	න	
සකා වළකිනු සිලැයි	දැනගෙන	**(44 කවිය)**

කයින් සිදුවන වැරැදි ක්‍රියා තුනෙන් වැළකීම (සම්මා කම්මන්ත) වචනයෙන් සිදුවන වැරැදි ක්‍රියා සතරින් වැළකීම (සම්මා වාචා) නොකළ යුතු වෙළෙඳාම් පසෙන් වැළකීම (සම්මා ආජීව) සීලය නම් වේ.

සිත කිලුටු කර	නා	
රාගාදි පව් මඬ	නා	
සිතිවිලි බාව	නා	
දෙකෙකි විදසුන් සමත	විසිනා	**(45 කවිය)**

සිත කිලුටු කරවන රාගාදී පව් මඬින නොහොත් මර්දනය කරන සිතිවිලි භාවනා නම් වේ. ඒවා විදර්ශනා හා සමථ වශයෙන් දෙකකි.

මෙයින් පරලොව	පත්	
උදෙසා එබඳු	පේසත්	
දෙනු නිසි අහර	වත්	
දනෙහි අනුසස් වේ ය පින්	පෙත්	**(46 කවිය)**

මෙලොවින් පරලොව ගිය ප්‍රේත ආදි සත්ත්වයන් උදෙසා දෙනු ලබන නිසි ආහාර වස්ත්‍ර දානයන්හි ආනිශංස පිංපෙත් නම් වේ.

නො කැමැති මසුරු	දොස්	
දුරලා වෙමින් සිත	තොස්	
අනුන් දුන් පින්	රැස්	
ගැනුම් අනුමෝදනය සොඳ	ලෙස්	**(47 කවිය)**

නොකැමැතිකම් මසුරුකම් ඉවත් කර සිත සතුටින් යුතු ව අනුන් විසින් දෙනු ලබන පින් රස හොඳින් ගැනීම අනුමෝදනයයි.

නො හැඟ පුද ලබ යසස
හිත අදහසින් මුනි බස
අන් හට මොක් පිණිස
කියනු දේසනි මහත් අනුසස (48 කවිය)

පූජාවක් හෝ කීර්තියක් ලැබීමේ අදහසින් තොර ව මෝක්ෂය සඳහා ම මුනිඳු දෙසුම් අනුන් හට දේශනා කිරීම මහත් ආනිශංස දායක දේශනා කුසලයයි.

මෙ බණ ම ඇසූ කල
ඇතැයි සිතමින් පින් පල
එකඟ ව මුනි තෙපල
අසනු බණසන කුසල මනකල (49 කවිය)

මේ බණ පමණක් ඇසීමෙන් වුව ද ලබන පින් මහත් ඵලයයි සිතා බුදුරජාණන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කිරීම බණ ඇසීමේ කුසලයයි.

ගුණයෙන් පසු නොබට
මුනිවර කුල දෙටුන් හට
වැඳුම් ඈ නිසි කොට
කරනු පුද වේ මනා දෙලොවට (50 කවිය)

ගුණවත්කමින් යුතු යතිවරුන්ට සහ කුල පරම්පරාවේ වැඩිහිටි අයට වැඳුම් ආදිය නිසියාකාර ව කිරීම දෙලොවට ම හොඳ වූ අපචායනය කුසලය වේ.

පින් කිරියෙහි නොහොත්
ගිලන් ගුණවත් හට වත්
කරනු මෙහෙ යහපත්
වතාවත් නම් වෙතී තෙපලත් (51 කවිය)

පුණ්‍ය ක්‍රියාවන්හිදීත්, ගිලන් ගුණවත් අය හටත් යහපත් මෙහෙවර කිරීම වත්‍රාවන් බව පැවසේ.

සතහට පින් කරන
සතුටු වීරිය වඩවන
ඔවුන් ගුණ පවසන
කලට පැසසුම් කුසලි දස වන **(52 කවිය)**

පින් කරන සත්ජනයාගේ සතුට හා වීර්යය වැඩි කරවන, ඔවුන්ගේ ගුණ පවසා ප්‍රශංසා කිරීම දස වන කුසලයයි.

පහවූ කෙලෙස් රණ
ලොවැ, දුරු නැණ කුලුණු ගුණ
සලකා කැර සරණ
ගැනුම් මෙ සරණ කුසලි රජ මෙන **(53 කවිය)**

ලෝකයට ගුරු වූ බුදුරජාණන් වහන්සේගේ ප්‍රහීණ කළ කෙලෙස් ඇති බව ද, කරුණා ගුණය හා ඥානය ද සලකා බුදුසරණ යාම, රාජ්‍යයක් හෝ රජු හෝ සමාන සරණ කුසල නම් වේ.

දන් සිල් ඈ කුසල්
අනුසස් විසින් හැම කල්
සඳහන් වනු විමල්
සිතින් සිහිහම් කුසලි මනකල් **(54 කවිය)**

දාන සීලාදි ක්‍රියාවන්හි ආනිශංස හැමවිට ම පිරිසිදු සිතින් සිහි කිරීම අනුස්සති කුසලය වන්නේ ය.

කළ මේ පින් දොළොස
අත් පත් සිත් රුවන් ලෙස
පැතු යම් අදහස
ලෙසට සගමොක් යනු සැබෑ බස **(55 කවිය)**

මෙම පින්කම් නොහොත් පුණ්‍ය කර්ම දොළොස කිරීමෙන් චින්තා මාණික්‍යක් ලැබුණ ලෙස පැතූ අදහස් අනුව දෙලොවට ම හා නිවනට යන්නේ යයි කීම සත්‍ය වචනයකි.

සාරාංශය

පුණ්‍ය ක්‍රියා පිළිබඳ සඳහන් කිරීමේ දී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා, දස පුණ්‍ය ක්‍රියා සහ දොළොස් පුණ්‍ය ක්‍රියා යනුවෙන් ආකාර කිහිපයකට දක්වා ඇත. ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමිපාණන් වහන්සේ විසින් උලකුඩය දේවියගේ ඉල්ලීම පරිදි රචනා කරන ලද කාව්‍යශේඛරයේ නව වන සර්ගයේ මේ දොළොස් පින් කිරියවත් ගැන සඳහන් වේ. මේ පින් කිරියවත් අනුගමනය කිරීමෙන් ස්වර්ග මෝක්ෂ ප්‍රතිලාභය ලබා ගත හැකි බව අවබෝධ කර ගත හැකි ය.

ක්‍රියාකාරකම

1. කාව්‍යශේඛරයේ සඳහන් දොළොස් පින්කිරියවත් පිළිවෙළින් නම් කරන්න.
2. මෙහි සඳහන් දාන වස්තු දහය පිළිවෙළින් ලියන්න.
3. පාසලේ වෙසක් උත්සවය මුල් කරගෙන මේ දොළොස් පින් කිරියවත් අතරින් සිදු කළ හැකි පුණ්‍ය ක්‍රියා පිළිබඳ පත්‍රිකාවක් සකසන්න.

පුහුණුවට

වැනුවා නම් බුදු ගුණ　　වැනුවා ම ය
තැනුවා නම් තම සිත　　තැනුවා ම ය
දෙනුවා නම් දන් පින්　　දෙනුවා ම ය
දිනුවා නම් පරලොව　　දිනුවා ම ය

දැනුම සඳහා

1. සමනා - භික්ෂූන් වහන්සේලා
2. වතාවත් - අවශ්‍ය සේවා සැපයීම
3. දන්වත් - දන් පිණිස දෙන දෑ
4. යහන - ඇඳ පුටු මේස ආදිය
5. ලොබ ඇරි - ලෝභය හැර
6. පසක් වෙළෙඳාමෙන - නොකළ යුතු වෙළෙඳාම් පහ
7. පේසත් - ප්‍රේත ලෝකයෙහි ඉපදුණු අය
8. මුනි තෙපල - බුද්ධ ධර්මය
9. කුල දෙටුවන් - පරම්පරාවේ වැඩිහිටි අය
10. කුසලී - කුසලයකි
11. විමල් - පිරිසිදු
12. සගමොක් - දිව්‍ය මානුෂික සම්පත් හා නිවන
13. සිත් රුවන - සිතූ පැතූ සම්පත් දෙන මැණික
14. සැබෑ බස - සත්‍ය ම වචන